# MBSL හා ලංකා අශෝක් ලේලන්ඩ් වෙතින්
## DOST ට්‍රක් සදහා විශේෂ ලීසිං පැකේජයක්

කොරෝනා රෝග වසංගතය නිසා අඩ-පණ වූ ව්‍යාපාර කටයුතු නැවත පටන් ගෙන නව ජවයකින් ඉදිරියට ගෙන යෑම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට අත-හිත දීමට මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී (MBSL) ආයතනය, ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම සමඟ අත්වැල් බැදගෙන ඇත. ඒ අනුව යුරෝ **IV** නව තාක්ෂණයෙන් නිෂ්පාදිත **DOST** වර්ගයේ ට්‍රක් රථයක් ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමෙන් එකවර මුදල් ගෙවා මිලදී ගැනීමට අපහසු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට MBSL ආයතනයේ විශේෂ ලීසිං පැකේජයක් යටතේ මිලදී ගැනීමට පහසුකම් සලසා ඇත.

ලියාපදිංචිය සහ රක්ෂණය නොමිලේ, වෙළෙඳපොළේ අවම මාසික වාරිකය, ආදායමට සරිලන ලෙස වාරික ගෙවීමේ හැකියාව, වසර 6 ක් දක්වා ගෙවීමේ හැකියාව, අවම ලියකියවිලි, කඩිනම් එක් දින සේවය MBSL ආයතනයේ විශේෂ ලීසිං පැකේජය යටතේ පාරිභෝගිකයන්ට ලැබෙන විශේෂ වරප්‍රසාද වේ.

MBSL සහ ලංකා අශෝක් ලේලන්ඩ් හවුල්කාරිත්වය පිළබඳ අදහස් දක්වන MBSL ආයතනයේ වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරී ජූඩ් ගමලත් මහතා......''කොරෝනා රෝග වසංගතය හේතු කරගෙන රටේ ජාතික ආර්ථිකයේ යම් පසුබෑමක් ඇතිවී තිබෙනවා. ජාතික ආර්ථිකය නැවත යථා තත්වයට පත් කිරීම සඳහා එයට ඉමහත් දායකත්වයක් ලබා දෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නැවත ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. නමුත් මේ අවස්ථාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ව්‍යාපාර නැවත ගොඩ නැගීම සඳහා ප්‍රාග්ධනය සොයා ගැනීම අපහසුයි. රටේ ආර්ථික සංවර්ධනයට සහයෝගය ලබා දෙන වගකිව යුතු මූල්‍ය ආයතනයක් හැටියට අප ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම සමඟ සහයෝගයෙන් මෙවැනි මූල්‍ය පහසුකමක් හඳුන්වාදීමට කටයුතු කළේ එම නිසයි.''

MBSL ආයතනය සමඟ ඇති කරගත් හවුල්කාරිත්වය පිළිබඳව අදහස් දක්වමින් ලංකා අශෝක් ලේලන්ඩ් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී උමේශ් ගෞතම් මහතා සඳහන් කළේ, ''ශ්‍රී ලංකාවේ ප්‍රවාහන විසඳුම් සඳහා පුරෝගාමීත්වයේ සහ මූලිකත්වයේ ලංකා අශෝක් ලේලන්ඩ් ආයතනය කටයුතු කර තිබෙන බවයි.''

''අපගේ ප්‍රවාහන විසඳුම් සෑම විටම අප පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සහ උවමනා මත කේන්ද්‍රගත වී ඇති අතර ඒ සඳහා සුදුසුම ආර්ථිකමය, සුවපහසුව සහ ආරක්ෂාව සලසයි. මේ වනවිට මුළු රටම ආර්ථික වශයෙන් දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින අතර අනාගතය අවිනිශ්චිත බවකින් ද යුක්ත වේ. වෙළෙඳපොළේ නව රැකියා

අවස්ථා ලබා ගැනීමේ ධනාත්මක සලකුනු නොමැතිව, පවතින රැකියා රඳවා ගැනීමට සමාජයට අපහසු වන මෙහොතක, ප්‍රමුඛ පෙළේ සමාගමක් වශයෙන් අප රටේ දහස් ගණන් තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබා දීමට ඉදිරිපත් වීම අපගේ යුතුකම වේ. ඒ වෙනුවෙන් අප, සමාජයට යහපතක් අත්කර දීමේ අභිප්‍රාය ඇතිව, අපගේ සැහැල්ලු වාණිජ වාහනය වන ''ඩොස්ට්-**DOST**'' රටපුරා හඳුන්වා දෙමින් ස්වයං රැකියා අවස්ථා සමඟ අද්විතීය විසඳුම් ලබා දීමට අපි MBSL ආයතනය සමඟ කටයුතු කරන්නෙමු.''

අශෝක් ලේලන්ඩ් වාණිජ වාහන ක්‍රමානුකූලව එකලස් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ඉන්දියාවේ අශෝක් ලේලන්ඩ් සමාගම අතර ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස 1982 දී ලංකා අශෝක් ලේලන්ඩ් පීඑල්සී ආයතනය සංස්ථාගත කරන ලදී. දශක හතරකට ආසන්න කාලයක් තිස්සේ, ලංකා අශෝක් ලේලන්ඩ් වාහන, මිලියන ගණනක් ජනයා සහ ටොන් ගණනක් භාණ්ඩ ශ්‍රී ලංකාව පුරා ගෙන යමින් සිටී. අශෝක් ලේලන්ඩ් වාහන 70,000 කට ආසන්න සංඛ්‍යාවක් රටේ ආර්ථිකයට විශාල පිටුවහලක් වී ඇති අතර සන්නද්ධ හමුදාවන්ට ප්‍රධාන වාහන සැපයුම්කරු ලෙස රටේ ආරක්ෂාව සඳහා ද වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

1982 දී ආරම්භ කරන ලද MBSL ආයතනය 1991 දී කොළඹ කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි කළ පොදු සමාගමක් බවට පත්විය. වර්තමානයේ එය ශ්‍රී ලංකාවේ ආයෝජන සහ ව්‍යාපාරික මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ අති සාර්ථක පුරෝගාමී මූල්‍ය ආයතනයක් ලෙස ස්වකීය ගනු-දෙනුකරුවන්ට ලීසිං පහසුකම්, සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා මූල්‍ය පහසුකම්, වෙළෙඳ ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම්, සංස්ථාපිත උපදේශක සේවා, කොටස් වෙළෙඳපොළ කටයුතු, ස්ථාවර තැන්පතු, ඉතුරුම් ගිණුම්, ළමා ඉතුරුම් ගිණුම්, දේපළ වෙළෙඳාම සහ රන් ණය සේවා යනාදි මූල්‍ය සේවා රැසක් සපයයි.

MBSL ආයතනයේ විශාලතම කොටස් හිමියා වන්නේ ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය බැංකුව වන ලංකා බැංකුවයි. ලංකා බැංකුවේ උපාය මාර්ගික කොටස් ප්‍රමාණය 74%කි. MBSL ආයතනයේ දිවයින පුරා ප්‍රධාන ශාඛාව ඇතුළුව ශාඛා සහ ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන 49 ක් ස්ථාපිත කර ඇත.